## දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - 2012

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**(ඇ)** 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුම්වලින් ආපසු ගැනීම් සහ එම ගිණුම්වලට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

**(ඈ)** ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර), කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

**(ඉ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, හා

**(ඊ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 10,555,355,748 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 85,439,740,790 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | (4,119,579)* | (4,075,291) | 20,451,516 |
| කෙරීගෙන යන වැඩ | 10,559,475,327 | 8,662,278,607 | 85,419,289,274 |
| | 10,555,355,748 | 8,658,203,316 | 85,439,740,790 |

* වත්කම් ක්ෂය වීම් හා මාර්ග සංවර්ධන අධිකාරියට වත්කම් මාරු කිරීමේ හේතුවෙන්

2.2 **අග්‍රිම අරමුදල් ගිණුම්**

කොට්ටාව සිට පින්නදුව කොටස 2011 වර්ෂයේ සම්පූර්ණ කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදීත් සමහර ගනුදෙනු නිරවුල් වෙමින් පැවතුණි. මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුම්වල මෙහෙයුම්, සාරාංශ කර පහත දැක්වේ.

| | ආසියානු සංවර්ධන බැංකුව | | නෝර්වීජියානු සංවර්ධන අරමුදල (නෝ.සං.අ.) | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො | ශ්‍රී.ලං.රු | එ.ජ.ඩො | ශ්‍රී.ලං.රු |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 1,749 | 199,264 | 2,834 | 269,454 |
| **එකතු කළා :** | | | | |
| ඌන පූරණයන් | 680,432 | 80,346,295 | නැත | නැත |
| විදේශ විනිමය වාසිය | - | 1,926,811 | - | නැත |
| | 682,181 | 82,472,370 | | 269,454 |
| **අඩු කළා :** | | | | |
| ආපසු ගැනීම | 604,511 | 72,595,777 | නැත | නැත |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 77,670 | 9,876,593 | 2,834 | 269,454 |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

බලපෑම්වලට ලක්වූවන්ට ගෙවූ රු.මිලියන 2,422 ක ව්‍යවස්ථාපිත වන්දි මුදල්, වර්ෂයේ "ලාක්" වන්දි (ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව) රු. මිලියන 1,956 ක් සහ වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා ගෙවූ පොලී මුදල් රු.මිලියන 363 කින් සමන්විත විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

මහාමාර්ග අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2006 සැප්තැම්බර් 08 දිනැති අංක එම්එච්/ඩබ්/1/93 දරන චක්‍රලේඛය අනුව ඉඩම්හිමියනගේ ඉල්ලීම පදනම් කරගෙන අත්පත් කරගත් ඉඩම් සඳහා තක්සේරු වාර්තාව මත සියයට 25 ප්‍රසාද දීමනා හා ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචි කිරීමේ කමිටු ක්‍රියාවලි දීමනා ලබාගැනීමට හිමිකමක් නැත. එයට පටහැනිව ඉඩම්හිමියන්ගේ ඉල්ලීම මත අත්පත් කර ගත් ඉඩම් සඳහා ප්‍රසාද දීමනා ලෙස රු. 624,950 ක් ඉඩම්හිමියන් තිදෙනකුට ගෙවා තිබුණි.

### 3.2 පොදු පරිපාලනය

#### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක සමඟ ව්‍යාපෘති ප්‍රධාන කාර්ය මණ්ඩල වගකීම් හා සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ යුතු ක්‍රියාකරකම් පැහැදිලිව හඳුනාගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් එසේ පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් සැලසුම් කළ අරමුණු ළඟා කර ගැනීම් බැහැරවීම් ඇත්නම් නිවැරදි කරගැනීම හා අවශ්‍ය වෙනස්කම් සිදුකර ගැනීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් වශයෙන් විධිමත්ව ඇගයීමට නොහැකි විය.

**(ආ)** භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අනුමත කර ඇතත් අදාළ අනුමැතියකින් තොරව දේශීය උපදේශකවරුන් 4 දෙනෙකු බඳවාගෙන රු. 2,996,075 ක් ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

#### 3.2.2 කොන්ත්‍රාත්තු පරිපාලනය

**(අ)** ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සැපයූ කුරුඳුගහහැතැක්ම සිට පින්නදූව දක්වා වූ මාර්ග කොටසේ පොලිස් වාහන නතර කර තැබීමේ කොටසේ ඉදිකිරීම් කටයුතු පුද්ගලික සමාගමකට රු. 10,601,637 ට ප්‍රදානය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.3.1 (අ) අනුව සිවිල් වැඩ ආරම්භ කිරීමට ප්‍රථම ඉංජිනේරු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතුය. කෙසේවෙතත් ආසියානු සංවර්ධන බැංකු අරමුදල් කොටසේ පොලිස් වාහන නතර කර තැබීම සඳහා වූ ඉදිකිරීම්වල ඉංජිනේරු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව රු. 11,873,833.81 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.3.1 (ඇ) අනුව භෞතික අසම්භාව්‍ය වියදම් සඳහා සියයට 10 ක් ඇස්තමේන්තුවල වෙන්කිරීම් කළ යුතුය. පොලිස් වාහන නවතා තැබීමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළව ව්‍යාපෘතිය විසින් එම අවශ්‍යතාවයන්ට පටහැනිව ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර රු. 2,493,834 ට සමාන සියයට 26 ක විචලන නියෝගයක් මගින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**(iii)** පොලිස් වාහන නවතා තැබීමේ ඉදිකිරීම්වලට අදාළව ටෙන්ඩර් ලියකියවිලි ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්කරුවෙකුට රු. 8,375,000 ක කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර කළ වැඩ සඳහා මිනුම් ලබාගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** කොට්ටාව පින්නදූව මාර්ග කොටසේ සිදුකරන ලද සමහර ඉදිකිරීම් වැඩ සඳහා ව්‍යාපෘතිය රු. 5,321,436 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත් අදාළ පිරිවැය ඇස්තමේන්තු හා අනුමත අරමුදල් වෙන්කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

3.2. 3 <u>රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** පැකේජ 1 විශේෂිත කොන්ත්‍රාත්තු කොන්දේසි ඡේද 14.2 අනුව භාරගත් කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 20 ක් පමණක් අත්තිකාරම් ලෙස ගෙවිය යුතුය. කෙසේවෙතත් රජයේ ප්‍රසම්පාදන පරිපාටියේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවී අන්තර් ගෙවීම් සහතික 14 මගින් රු. 522,272,250 ක් අතිරේක අත්තිකාරම් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

**(ආ)** 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ව්‍යාපෘති පොදුකාර්ය වියදම් ලෙස රු.1,961,127 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

4. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>මූල්‍ය කාර්ය සාධනය</u>

**(අ)** ආසියානු සංවර්ධන බැංකුවෙන් රු. 1,119,005,069 ක් වර්ෂය තුළ බිල්පත් නිරවුල් කිරීම සඳහා ලැබී තිබුණි.

**(ආ)** පින්නදූව සිට ගොඩගම මාර්ග කොටස සඳහා එක්සිම් බැංකුවෙන් රු. බිලියන 18.7 ක් ලැබී තිබුණි. විස්තර පහත දැක්වේ.

| පැකේජ | ආරම්භක කොන්ත්‍රාත් මිල | 2012 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත | |
|---|---|---|---|
| | | ඉලක්කය | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පැකේජ I (පින්නදූව සිට කෝදාගොඩ) | 10,170 | 4,026.66 | 1,953.75 |
| පැකේජ II (කෝදාගොඩ සිට ගොඩගම) | 8,530 | 3,873.11 | 2,642.76 |

## 4.2 භෞතික කාර්යසාධනය

කොට්ටාව සිට පින්නදූව (ගාල්ල) දක්වා වූ කි.මී. 95.05 කොටස හා ගාලු වරාය ප්‍රවේශ මාර්ගය (කි.මී. 5) වැඩ නිමකර 2011 නොවැම්බර් 27 දින රථවාහන ගමනාගමනය සඳහා විවෘත කර ඇත. පින්නදූව සිට ගොඩගම දක්වා වූ ඉතිරි කොටස (කි.මී.30) ඉදිකිරීම් කරගෙන යනු ලැබේ. ඉතිරි කොටසේ 2012 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය පහත පරිදි වේ.

| පැකේජ | ඉලක්කය | තථ්‍ය | පසුබෑම |
|---|---|---|---|
| පැකේජ I (පින්නදූව සිට කෝදාගොඩ) | 47.76% | 26.11% | - 21.65% |
| පැකේජ II (කෝදාගොඩ සිට ගොඩගම) | 48.00% | 37.64% | - 10.36% |